**මධ්‍යම පළාත් සභාව - 2021 වර්ෂය**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මධ්‍යම පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 දෙසැම්බර් 12 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 දෙසැම්බර් 15 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂයේ මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ගෙවීම් නිම කර තිබුණු මධ්‍යම පළාත් සභාවට මිලදී ගත් ඉන්වොයිස් වටිනාකම රු.144,713,400 ක කැබ් රථ 50 ක් සහ වෑන් රථ 10 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | වාහන වල කල්බදු වාරික ගෙවා අවසන් කර ඇත. එම වාහන අදාළ කාර්යාල වෙත පවරා දී ඇති අතර, එම කාර්යාල විසින් වාහනවල වටිනාකම ගිණුම් සාරාංශ මඟින් වාර්තා කළ පසු තොරතුරු ඒකාබද්ධ කර ඉදිරිපත් කිරීම සිදු කරන බව දන්වමි. | ගෙවීම් අවසන් කර ඇති වාහන වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) පේෂකර්ම දෙපාර්තමේන්තුව සතු රු.11,690,000 ක ඉඩම් වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල හා මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | තක්සේරු කරන ලද ඉඩම් වල රු.11,690,000 ක අගය සිගාස් වැඩසටහනට නිවැරදිව ඇතුලත් කර ගැනීමට නොහැකි වූ නිසා එම වටිනාකම සිගාස් වැඩසටහනෙන් ඉවත් කර ගැනීමට ඉඩම් වල වටිනාකම වූ 11,690,000 හර කර නැවත බැර කරන ලද බවත් ඒ අනුව ගිණුම් සටහන් වල ද්වි ගණන දෝෂයක් සිදුවී නොමැත. | ඉඩම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |
| (ඇ) මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ පළාත් අධ්‍යක්ෂ කාර්යාලයට හා නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලවලට මිලදීගෙන තිබුණු රු.7,942,059 ක වාහන, කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ | මෙම වටිනාකමින් රු.2,570,752 ක වත්කම් පළාත් කාර්යාලයෙන් මිලදී ගෙන ඇති අතර එම වත්කම් 2022 ජූලි මස CIGAS වැඩසටහන මඟින් ගිණුම්ගත කර ඇත. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවලට අයත් ඉතිරි | වර්ෂය තුළදී මිලදී ගත් සියළු වත්කම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ හා මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | රු.5,371,307 ක වත්කම් ප්‍රමාණය මෙම වර්ෂයේ ඉදිරි කාල සීමාව තුළ CIGAS වැඩසටහන මඟින් ගිණුම්ගත කරමි. | |
| (ඇ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ නොපියවූ රු.1,903,836 ක අත්තිකාරම් අඩුවෙන් දක්වා තිබීම නිසා, සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ හා පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වර්ෂයට අදාළ නොපියවූ කුලී හා වැඩ අත්තිකාරම් පිළිබඳ සියළු තොරතුරු මූල්‍ය ප්‍රකාශනය තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ නිවැරදි ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු දේපල පිරියත හා උපකරණ එකතු වටිනාකම රු.48,022,381 ක් ද, පළාත් ආණ්ඩුකාර කාර්යාලයට අයත් දේපල පිරියත උපකරණ වටිනාකම රු.3,618,853 ක් හා වාහන 11 හි පිරිවැය රු.129,800,000 ක් ද එම ආයතන වල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබීමෙන් මධ්‍යම පළාත් සභා මූල්‍ය ප්‍රකාශනයේද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | • ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් මුළු වටිනාකම රු.73,292,810 කි. එයින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ වියදම් වී ඇති මුදල වන්නේ රු.37,306,520 කි. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම ඇතුළු අනෙකුත් සංවර්ධන කටයුතු වලට අදාල වියදම් වලින් වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු උපකරණවල වටිනාකම රු.30,318,179 ක් වන අතර, වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට අවශ්‍ය නොවන භාණ්ඩවල වටිනාකම රු:140,670 ක් හා වෙනත් සේවාවල වටිනාකම | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා ආණ්ඩුකාර කාර්යාලයේ නිවැරදි වත්කම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

රු.5,510,343 කි. ඒ අනුව වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු උපකරණ වටිනාකමින් රු.25,270,429 ක උපකරණ වත්කම් ලෙස ගිණුම්ගත කර ඇති අතර, තවදුරටත් ගිණුම්ගත කළ යුතු වූ උපකරණ වටිනාකම වූයේ රු.5,047,750 කි.

- ආණ්ඩුකාර කාර්යාලයේ 2020 වර්ෂය තුළ සිදුකරන ලද මිලදී ගැනීම් වටිනාකම පමණක් ආරම්භක ශේෂය ලෙස ඇතුලත් කිරීම හේතුවෙන් මෙම වෙනස ඇතිවී ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 540 - ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 ජූනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 (i) සහ 2021 ඔක්තෝබර් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021 (v) හි 07 ඡේදය පරිදි සේවකයන් සේවයට පැමිණීම හා පිටවීම, ලබාගත් නිවාඩු ආදිය පිළිබඳ ලිඛිත සනාථ කිරීම් නොමැතිව ආණ්ඩුකාරවරයාගේ පුද්ගලික කාර්ය මණ්ඩලයේ සේවකයන් 09 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.1,990,147 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි. | විගණනයෙන් පෙන්වාදීමෙන් පසුව පැමිණීම හා පිටවීම, ලබාගත් නිවාඩු ආදිය පිළිබඳව ලේඛන පවත්වාගෙන යනු ලබන අතර ඒ අනුව වැටුප් ගෙවනු ලබන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2 මාර්ගෝපදේශය අනුව සමාලෝචිත වර්ෂයට අදාළව මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හෝ වාර්ෂික විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමකින් තොරව රු.3,767,537 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි. | විගණනය විසින් පෙන්වාදුන් පරිදි ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට 2022 වර්ෂය සඳහා කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතු වේ. |

### 1.5.2 ශීර්ෂය 541 - සභා ලේකම් කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 (i) සහ 2021 ඔක්තෝබර් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021 (v) හි 07 ඡේදය පරිදි සේවකයන් සේවයට පැමිණීම හා පිටවීම, ලබාගත් නිවාඩු ආදිය පිළිබඳ ලිඛිත සනාථ කිරීම් නොමැතිව මධ්‍යම පළාත් සභාවේ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයේ සේවකයන් 13 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ තුළ දී රු.7,260,274 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි. | ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද පෞද්ගලික කාර්යමණ්ඩලයේ වැටුප් හා වේතන ගෙවීම් සිදු කර ඇත්තේ එක් එක් මාසය සඳහා පෞද්ගලික කාර්යමණ්ඩලයේ පැමිණීම පිළිබඳව ගරු සභාපතිතුමා ලබාදී ඇති සහතික අනුව වන අතර 2022 අගෝස්තු 01 සිට ක්‍රියාත්මක වන පරිදි 18 වැනි පොදු ආකෘති පත්‍රය අනුව සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයේ පැමිණීම සහ පිටවීම වාර්තා කිරීමට පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව පැමිණීම් පිටවීම් වාර්තා පවත්වා ගත යුතුය. |

### 1.5.3 ශීර්ෂය 542 - ප්‍රධාන ලේකම් කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් සභා සංකීර්ණය පිහිටි ඉඩම හා එහි ස්ථාපිත ගොඩනැගිලි තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. | පළාත් සභා ගොඩනැගිල්ල හා පරිශ්‍රය සඳහා රක්ෂණාවරණයක් ලබා ගැනීමට ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කර ඇති අතර තක්සේරු වටිනාකම ලැබුණු පසු මූල්‍ය ප්‍රකාශන වල | ඉඩම කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ඉඩමෙහි හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු |

| | | |
|---|---|---|
| | වාර්තා කරන බවත් පළාත් සභා සංකීර්ණය පිහිටි ඉඩම් විධිමත්ව පවරාගැනිමෙන් පසු ඉඩමට අදාළ තක්සේරු වටිනාකම ලබාගැනිමටත් කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |

### 1.5.4 ශීර්ෂය 545 - පළාත් මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 116 අනුව හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව එකතු කරන නිලධාරින් ඒ පිළිබඳ අවධානයෙන් හා ඉතා සැලකිලිමත්ව සිටිය යුතු අතර, අවශ්‍ය අවස්ථා වලදී නියමිත කාලය තුල නීති මඟින් කටයුතු කිරීම සඳහා විධිවිධානයන් යෙදීම ගැනද ඔහු වගකිව යුතු වුවද, ආදායම් විෂයයන් 05 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.96,651,994 ක හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | පෙන්වා දෙන ලද කරුණු නිවැරදි බව සඳහන් කරමි. වර්ෂ කිහිපයක එකතුවක් ලෙස ගණනය වන හිඟ බදු මුදල, හිඟ පාලන ගිණුම මඟින් ඉදිරිපත් කරන අතර ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 හිම 2021 ජනවාරි 01 දිනට ඇස්තමේන්තුගත හිඟ බදු මුදල් ප්‍රමාණය රු.මි. 65.96 ක් විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකරගත යුතුව තිබුණු රු.30,189,910 ක හිඟ බදු මුදල විගණනය මඟින් පෙන්වා දුන් නිරීක්ෂණ හා පසු විපරම් කිරීමේදී හඳුනාගන්නා ලද මඟහැරීම්ද අනුව 2021 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ශේෂය රු.29,655,237 ක් ලෙස සංශෝධනය විය යුතු බව සඳහන් කරමි. | මූල්‍ය රීති ප්‍රකාර හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පළාත් පාලන ආයතනය වෙත බෙදාහැරීමට රු.1,764,133,363 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභාවට ලැබී තිබුණ ද පළාත් සභාව විසින් රු.151,549,482 ක් එනම් ලැබුණු මුදලින් සියයට 8.5 ක් පමණක් බෙදා හැර ඉතිරි රු.1,612,583,881 ක මුද්දර ගාස්තු රඳවා ගෙන තිබුණි. ඒතුළ අදාළ පළාත් පාලන ආයතනය අපහැදිලි වීම හේතුවෙන් එකතු වූ රු.115,989,520 ක මුද්දර ගාස්තු ද ඇතුළත්ව තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල රැස්කළ ආදායම රු.1,764,133,363 කින් 2021 වර්ෂය තුලදී රු.151,549,482 ක මුදලක් ආපසු ගෙවා ඇත.<br>ගෙවීම් සිදු කිරීමේ දී දේපල හිමිකම් පැවරීම මත රැස් කරන ලද සියලුම උපලේඛනයන් එක් එක් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විසින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලබයි. සමාලෝචිත වර්ෂයතුල ඉහත අපහැදිලි වීම හේතුවෙන් එකතු වූ රු.129,739,276 මුදලින් 2022 සැප්තැම්බර් 30 දිනට රු.13,749,756 මුදලක් ගෙවා ඇත. ඉතිරි ප්‍රමාණයද ඊට අදාළ උපලේඛන ඉදිරිපත්වීම අනුව ගෙවීම් කටයුතු සිදුකිරීමට ඉදිරියේදි පියවර ගනු ලබයි. | පළාත් පාලන ආයතන නිවැරදිව හඳුනා ගෙන ගෙවීම් කටයුතු සිදුකළ යුතුය. |

### 1.5.5 ශීර්ෂය 548 - මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 05 දිනැති අංක NSCC/3/01 Allowances දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සම සභාපති වරයාගේ ලිපිය අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති තුමා ඇතුළු සාමාජික මහතුන් වෙත දීමනා ගෙවීම් සම්බන්ධයෙන් මධ්‍ය පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් නිකුත් කරන ලිපි අදාළ | 2018 ජූලි 18 දිනැති අංක 03/18 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |

සභාපතිවරයාගේ සහ සාමාජික මහතුන්ගේ මාසික දීමනාව පිළිවෙලින් රු.15,000 ක් සහ රු.10,000 ක් විය. පළාත් ප්‍රධාන ලේකම්වරුන් අමතන ලද භාණ්ඩාගාර, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (i) ආ සහ (ii) ඡේදයන්ට අනුකූලව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව ආණ්ඩුකාර අනුමැතිය මත සමාලෝචිත වර්ෂය සඳහා පමණක් සභාපතිවරයාට සහ සාමාජික මහත්ම මහත්මීන්ට රු.1,280,000 ක මාසික දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

කර ගෙන ඇත. ඒ අනුව,

I. මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් නිකුත් කරන ලද ජී/සී/පී/2/01/37 හා 2010 ඔක්තෝබර් 06 දිනැති ලිපියට අනුව පිළිවෙලින් රු.15,000 ක් හා රු.10,000 ක් බැගින් ද,

II. අනතුරුව ආණ්ඩුකාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක GCP/10/03/02 හා 2020 ඔක්තෝබර් 21 දිනැති ලිපිය මගින් ලබා දී ඇති සංශෝධනය ප්‍රකාරව 2021 ජනවාරි මස සිට පිළිවෙලින් රු 35,000 ක් හා රු.25,000 ක් බැගින් ද ගෙවීම් කටයුතු සිදු කර ඇත. මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛය මගින් රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, අනුමත කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධ උපදෙස් පනවා ඇති අතර 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 හා 33 වගන්ති මගින් පළාත් රාජ්‍ය සේවා

කොමිෂන් සභා පත් කිරීම හා 33(5) වගන්තිය යටතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් එම පළාත සඳහා වූ පළාත් සභාව විසින් නිශ්චය කරනු ලබන බව ද දක්වමි. ඒ අනුව උක්ත චක්‍රලේඛය පරිදි මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය වන බව දන්වමි.

### 1.5.6 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 නොවැම්බර් 11 දිනැති පළාත් මූල්‍ය රීති 422 (ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධන) සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 වගන්ති වලට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමත මිලදී ගැනීම් සීමාව ඉක්මවා රු.1,587,200 ක සෘජු මිලදී ගැනීම් (වියලි ආහාර ද්‍රව්‍ය) සිදුකර තිබුණි. | පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 457(අ) ඡේදයෙහි දෙපාර්තමේන්තුවකට අවශ්‍ය වන බඩුබාහිරාදිය ලබා ගැනීමට බලය දෙනු ලැබ ඇති සාමාන්‍ය ක්‍රම යටතේ ආරක්ෂක සේවාවේ සහ පවිත්‍රතා සේවාවේ නියුතු සේවකයින් 640 කට වියළි ආහාර ලබාදීම සඳහා රු.1,587,200 ක් වැය කර මහනුවර සෙප්කෝ සුපර්, සී / ස මධ්‍යම පළාත් විවිධ සේවා සමුපකාර සමිති සංගමයෙන්, වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කරන ලදි. | පළාත් මූල්‍ය රීති හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතනයේ සේවයේ යොදවා සිටි පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවා කාලය 2019 අගෝස්තු 01 දිනෙන් පසු දීර්ඝ නොකර සේවකයන් 07 දෙනෙකු වෙනුවෙන් වැටුප් හා වේතන වශයෙන් රු.5,671,895 ක මුදලක් සහ ඉන් සේවකයන් 05 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දී වර්ෂ 03 කින් ගෙවා අවසන් කිරීමේ පදනම මත රු.200,000 බැගින් වූ රු.1,000,000 ක ණය මුදල් ලබාදී තිබුණි. | කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයේ ප්‍රඥප්තිය අනුව සෘජුව බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලයේ මේ වන විට සේවය කරනු ලබන 05 දෙනා සඳහා පමණක් ඔවුන්ට පෞද්ගලික වනසේ අන්තර්කාලීන විධිවිධාන යටතේ තනතුරු සඳහා 2018 අප්‍රේල් 01 දින සිට අන්තර්ග්‍රහණය කිරීමට 2018 මැයි 21 දිනැති අංක 47 දරන කළමණාකරන මණ්ඩල පත්‍රිකාවෙන් තීරණය කරන ලදි. මෙම ආයතනයේ සේවකයන්ට සහනදායි පදනමට ලබා ගැනිමේ හැකියාවක් නොමැතිවීම හේතුවෙන් නිළධාරින්ගේ ඉල්ලිම මත කළමණාකරන මණ්ඩලයේ අනුමැතියට යටත්ව රුපියල් ලක්ෂ දෙකක ණය මුදල ලබා දෙන ලදි.<br>එබැවින් මෙම නිලධාරින් 05 දෙනා සඳහා තාවකාලික පදනම මත බඳවා ගත් රියදුරු මහතාට හා සේවා කාලය දීර්ඝ කර ලබා දෙන ලද අතර අනෙක් රියදුරු මහතුන් දෙදෙනාහට වැටුප් ගෙවීම් සිදු කර ඇත. | සේවා කාලය දීර්ඝ නොකර සේවකයින් සඳහා වැටුප් ගෙවීම් හා ණය නිකුත් කිරීම නොකළ යුතුය. |

### 1.5.7 පළාත් පුස්තකාල සේවා මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1995 අංක 02 දරන පුස්තකාල ප්‍රඥප්තියේ 17 වන වගන්තිය අනුව මධ්‍යම පළාතේ පුස්තකාල අරමුදලට අදාළව ආරම්භයේ සිට මේ දක්වා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වෙමි. 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව සඳහන් කරමි. | ප්‍රඥප්තියට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.8 ශීර්ෂය 551 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතන 05 ක් සඳහා විගණකාධිපතිතුමා විසින් 2013 සිට 2020 අතර කාල පරාසය තුළ නිකුත් කර තිබූ අධිභාර සහතික 05 කට අදාළව රු.1,943,303 ක අධිභාර මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද අය කර නොතිබුණි. | මේ වන විට අධිභාර 05 කින් රු.1,943,303 ක් අය වීමට ඇත. එනම්,<br>• මාතලේ ප්‍රාදේශීය සභාවේ අධිභාර 02 කින් තිදෙනෙකුගෙන් රු.229,018 ක් ද තිදෙනෙකුගෙන් රු.119,000 ක් ද අයවීමට ඇත.<br>• මාතලේ ම.න.ස. - අභියාචනා තීරණ මෙතෙක් ලැබී නැත. රු.510,000 ක් අයවීමට ඇත. | අධිභාර නොපමාව අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | • උඩුනුවර ප්‍රාදේශීය සභවෙන් අධිභාර 02 කින් රු.1,020,465 ක් ද රු.64,820 ක් ද අයවීමට ඇත. | |
| (ආ) පළාත් පාලන ආයතන 47 ක අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේ දී අනුමත සේවක සංඛ්‍යාව ඉක්ම වූ සේවකයින් 268 ක් හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව 1676 ක් වූ අතර ඒ තුළ පළාත් පාලන ආයතන 15 ක ලේකම් තනතුර පුරප්පාඩුව පැවතුණි. | වෙනත් පත්වීම් බලධාරින් විසින් පත්වීම් ලබා දිය යුතු තනතුරු වලට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස අවස්ථා කිහිපයකදි ඉල්ලීම් කර තිබුණද මේ දක්වා එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොමැති අතර තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ වන තෙක් වැඩබැලීම සඳහා හා රාජකාරි ඉටුකිරීම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා කළමනාකරණ සේවයේ නිලධාරින් පත්කර ඇති බව සඳහන් කරමි. | පුරප්පාඩු පිරවීමට හා අවස්ථාවෝචිත පරිදි සභා ලේකම්වරු පත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 552 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------------------- | ----------- |
| (අ) නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල්වල ගුරුවරුන් 09 දෙනෙකුගේ පරිවාස කාලය සම්පූර්ණ වී තිබුණද, ප්‍රතිඵල සනාථ කර නොගැනීම සහ අදාළ ලියවිලි සම්පූර්ණ නොකිරීම මත සේවය ස්ථිර කිරීමේ නියමිත කාලය 2021 නොවැම්බර් 03 විගණිත දින | ලිපි ගොනුවල අඩුපාඩු සම්පූර්ණ කරමින් පවතින බව දන්වමි. | පරිවාස කාලය සම්පූර්ණ වූ ගුරුවරුන් ස්ථිර කිරීමට හෝ පරිවාස කාලය දීර්ඝ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වනවිට අවු 01 සිට අවු 14 ක කාල පරාසයක් දක්වා ප්‍රමාද වී තිබුණි. එහෙත් මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 11.2.3 ප්‍රකාරව පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවලංගු කිරීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ) | හැටන් කලාප අධ්‍යාපන කාර්යාලයේ 2019 මැයි සිට දෙසැම්බර් දක්වා නව වැටුප්තලවල පිහිටුවන ලද ගුරුවරුන් 22 දෙදෙනකුගේ රු.1,540,595 ක හිඟ වැටුප් 2021 අගෝස්තු දක්වා ගෙවීම් කර නොතිබූ අතර හැටන් කලාපයේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින පාසල් 04 ක ළමයින් 20 දෙනෙකු සඳහා කිසිදු ගුරුවරයෙකු අනුයුක්ත කර නොතිබුණි. | ප්‍රතිපාදන ලද විගස ගෙවීම් කරන බවත් විශේෂ අවශ්‍යතා ඇති පාසැල් වල ගුරු පුරප්පාඩු පවතින බවත් දන්වා ඇත. | හිඟ වැටුප් කඩිනමින් ගෙවීමටත් සේවයේ අවශ්‍යතාවය මත ගුරුවරු යොදා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලයේ වැටුප් සකස් කිරීමේ කාර්යයෙහි නිරතව සිටි නිලධාරියා විසින් පෞද්ගලික බැංකු ගිණුම් 09 ක් සහ හඳුනානොගත් බැංකු ගිණුම් 21 ක් මඟින් එකතුව රු.14,239,939 ක මුදලක් අඛණ්ඩව වසර 10 ක කාලසීමාවක් තුළදී දේපල ණය අවකරණ හා ශේෂ වැටුප් උපයෝගී කරගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකයේ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන පළාත් සභා ජංගම ගිණුම හරහා අයථා ලෙස පරිහරණය කර තිබුණි. මෙම මුදලින් | වැටුප් සැකසීමේදී වංචාවක් සිදුවී ඇති බවට අනාවරණය වූ අතර, වහාම ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් දැනුවත් කිරීමට කටයුතු කර මු.රෙ 104(3) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකිරීමට උපදෙස් ලබාදෙන ලදි. ඒ අනුව රු.10,423,348 ක ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම මුදල් වංචාව සිදුකර ඇති පුද්ගලයාගෙන් රු.10,543,018 ක මුදලක් අයකර ගැනීමට කටයුතු සිදුකර ඇත. | වංචා කළ සියළු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර එයට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2022 සැප්තැම්බර් 07 දින වන විට රු.3,696,920 ක මුදලක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි. | ප්‍රධාන ලේකම් විසින් මේ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් සිදුකිරීමට කටයුතු කළ අතර, එම විමර්ශණය අනුව රු.14,239,939 ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් වංචා කර ඇති බව අනවරණය වී ඇත. ඒ අනුව අයථා ලෙස පරිහරණය කර ඇති බවට අනාවරණය වී ඇති මුළු මුදලින් තව දුරටත් අයකරගැනීමට පවතින රු.3,696,920 ක මුදල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරියා දැනුවත් කර ඇත.<br>මෙම අක්‍රමිකතාවය සිදුකළ නිලධාරියා විසින් අයථා ලෙස මුදල් බැර කර තිබූ ගුරු සේවයේ නිලධාරිණියක වූ ඔහුගේ භාර්යාවගේ හා කලාප කාර්යාලයේ කාර්යාල කාර්ය සහයකගේ රාජකාරී වැඩ තහනම් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව දන්වමි. | |
| (ඇ) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ මිලදී ගන්නා ලද KDH හයිරූෆ් වෑන් රථ 03 ක් සඳහා වාහන නියෝජිත ආයතනය වන ටොයෝටා ලංකා පුද්ගලික සමාගමෙන් ප්‍රවර්ධන | අංක CPNC -5565 දරණ වාහනයට අයත් ශිත පෙට්ටිය එම වාහනයට සවිකර ඇති අතර, අංක CPNC – 6051 සහ CPNC – 5564 දරණ වාහන දෙකට අදාළ ශිත පෙට්ටි 02 අස්ථානගත වී ඇති | අස්ථානගත වූ භාණ්ඩ සම්බන්ධව විධිමත් පරීක්ෂණ පවත්වා අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යයක් ලෙස ලබා දී තිබුණු ශීතකරණ පෙට්ටි (Cool Box) 3 න් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශීතකරණ පෙට්ටි 02 ක් අස්ථාන ගතවී තිබූ අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බවට මූලික පරීක්ෂණය අනුව තහවුරු වී ඇති බැවින් මු.රෙ 104(4) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඒ සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. | |
| (ඉ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවලට අනුයුක්ත වාහනවලට සිදුවූ අනතුරු 70 කට අදාළව එකතුව රු.5,268,674 ක අලාභ හානි සම්බන්ධයෙන්, අනතුරු සිදු වී වසර 01 ත් 15 ත් අතර කාලයක් ඉක්ම ගොස් තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සිද්ධීන් 15 ක් පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති නමුත් අධිභාර කර ගැනීමට නොහැකි වී ඇත. | අනතුරු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කර අලාභහානි අය කර ගත යුතුය. |
| (ඊ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හැටන් කලාපයට අයත් පාසල් 147 න් පාසල් 121 ක පැවති රජයේ නිවාස 297 කින් 28 ක් අබලන් තත්ත්වයේ පැවති අතර 62 ක් නිෂ්කාර්යව පැවතුණි. | අබලන් තත්වයේ පවතින නිල නිවාස භාවිතයට ගත හැකි නිල නිවාස බවට පත්කිරීම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් තොරතුරු කැඳවීමට අනුව, පැවති නිල නිවාස 28 අතුරින් 20 ක් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර ඇත.<br>හැටන් කලාපයේ නිල නිවාස සඳහා ඉල්ලීම් කිසිවක් ඉදිරිපත් වී නොමැති බැවින් විගණන විමසුමේ සඳහන් නිල නිවාස 62 තවදුරටත් නිෂ්කාර්යව පවතින බව දන්වමි. | අබලන් නිවාස කඩිනමින් යථාතත්වයට පත් කළ යුතු අතර නිෂ්කාර්යව පවතින නිවාස, ඵලදායීව භාවිතයට යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඩ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වත්තේගම කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් මප/වත් ලුණුකැටියාමඩිත්ත විද්‍යාලය හා මප/වත්/කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රාථමික විද්‍යාලයට පත්වීම් ලැබූ ශිල්පීය නොවන සේවයේ සේවකයන් දෙදෙනෙකු එම පාසල් වල රාජකාරි වල නොයොදා, පිළිවෙලින් 2014 ජූලි මස සහ 2018 සැප්තැම්බර් මස සිට මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට අයත් පළාත් මාධ්‍ය ඒකකයට අනුයුක්ත කර, වර්ෂ 6 ත් 3 ත් අතර කාලයක් පුරාවට යථෝක්ත පාසල්වල වැටුප් ලේඛන වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා පිළිවෙලින් රු.3,043,724 ක් හා රු.951,575 ක් වශයෙන් එකතුව රු.3,995,299 ක වැටුප් ගෙවා තිබුණි. | විමසුමේ සඳහන් ශිල්පීය නොවන සේවයේ සේවකයන් දෙදෙනා වෙත ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මප/වත්/කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රාථමික විද්‍යාලයට හා මප/වත්/ලුණුකැටියාමඩිත්ත විද්‍යාලයට පත්වීම් ලබාදී ඇති අතර, ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි මඟින් මධ්‍යම පළාත් මාධ්‍ය ඒකකය වෙත හා ප්‍රධාන අමාත්‍යාංශයේ නැනෝදා අංශය වෙත අනුයුක්ත කිරීම් සිදු කර ඇති අතර, ඒ අනුව නිත්‍ය සේවා ස්ථානයෙන් වැටුප් ගෙවීම සිදු කර ඇති බව දන්වමි. | බඳවා ගැනීමේ අරමුණට අනුකූලව සේවයේ යෙදවීම කළ යුතු වේ. |
| (ඪ) | කටුගස්තොට, කොත්මලේ හා හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාල 03 කට අයත් පාසල් 134 ක ප්‍රාථමික ගුරු පුරප්පාඩු 170 ක් වූ අතර, කොත්මලේ හා හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාල 02 ට අයත් පාසල් 38 ක ප්‍රාථමික ගුරු අතිරික්තය 67 ක් විය. මෙම අතිරික්ත ගුරුවරුන් පුරප්පාඩු පවතින පාසල්වලට මාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මධ්‍යම පළාත සඳහා 29747 ක අධ්‍යයන කාර්යමණ්ඩලයක් අනුමත කිරීම සිදුකර ඇත්තේ, චක්‍රලේඛ 01/2016 අනුව 2018 වර්ෂයේදී, එවකට සිටි සිසුන් සංඛ්‍යාව පදනම් කරගෙන පාසල් පාදකව නොව කලාපය සඳහා මුළු ගුරු සංඛ්‍යාවක් ලෙසය.<br>එම අනුමත කාර්යමණ්ඩලය මේ වනවිට පාසල් වල පවත්නා ප්‍රායෝගික ගුරු අවශ්‍යතාවය සමඟ ගැලපීමක් සිදු නොවන බැවින්, එකම කලාපය තුල පාසල් වල ගුරු පුරප්පාඩු හා ගුරු | ප්‍රාථමික ගුරු අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වී කලාප වල ගුරුවරුන් අනුයුක්ත කිරීම කළ යුතුය. |

අතිරික්තතාවක් නිර්මාණයවී ඇත.

අධ්‍යයන කාර්යමණ්ඩලය නිර්ණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 06/2021 චක්‍රලේඛය පරිදි, 2021 මැයි මාසයේ සිටි ශිෂ්‍ය සංඛ්‍යාව මත පාසල් පාදකව අධ්‍යයන කාර්යමණ්ඩලය නිර්ණය කර අනුමත කිරීම සඳහා මේ වනවිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එම පාසල් පාදක අධ්‍යයන කාර්යමණ්ඩලය අනුමත වීමෙන් පසු තවදුරටත් පාසලක අතිරික්ත ගුරුවරුන් පවත්වා ගැනීමේ හැකියාවක් නොපවතින බව දන්වමි.

| | | |
|---|---|---|
| (ළ) මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල කලාප අධ්‍යාපන කාර්යාල 08 ක පාසල් 284 ක විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ නොකර විදුහල්පති තනතුරේ වැඩ ආවරණය සඳහා ගුරුවරුන් පත් කර තිබුණු අතර ඉහත සඳහන් කලාප අධ්‍යාපන කාර්යාල 08 න් කාර්යාල 03 කට අයත් පාසැල්වල අතිරික්ත විදුහල්පතිවරු 122 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. | මධ්‍යම පළාත සඳහා පත් කර එවන විදුහල්පති ශ්‍රේණිධාරීන් ස්ථානගත කිරීම් සිදුකරනු ලබන්නේ මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි.<br>2021 මැයි 31 දිනට කලාප 15 ට අදාළව සිංහල මාධ්‍ය විදුහල්පති පුරප්පාඩු 325 ක් හා දෙමළ මාධ්‍ය විදුහල්පති පුරප්පාඩු 250 ක් පවතී. මෙම පාසල් වල විදුහල්පති තනතුර පුරප්පාඩු වීමේදී වෙනත් විදුහල්පති ශ්‍රේණිධාරියෙකු යෙදවීමට නොහැකි අවස්ථාවන් වලදී, පාසලේ සිටින සුදුසු ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙකු විදුහල්පති | විදුහල්පති ශ්‍රේණි ධාරීන් ස්ථානගත කිරීම නිවැරදිව කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | තනතුරේ වැඩබැලීම සඳහා පත්කර, සිසු දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.<br><br>2021 දෙසැම්බර් 29 දින රේඛීය අමාත්‍යාංශයේ දැන්වීමට අනුව, විදුහල්පති ශ්‍රේණිධාරීන් බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, එමගින් මධ්‍යම පළාත සඳහා සිංහල මාධ්‍ය 335 ක් හා දෙමළ මාධ්‍ය 279 ක් ලෙස විදුහල්පති ශ්‍රේණිධාරීන් 614 ක් බඳවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | |

**1.5.10 ශීර්ෂය 553 - පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව පාසල් 58 ක පාසැල් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21 කට රු.62,342,772 ක මුදලක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | විමසුමේ සඳහන් සියළු පාසල් වල, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 555 - පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ තනතුරු 13 කට අදාළව පුරප්පාඩු 51 ක් පැවති අතර අනුමත නොවූ තනතුරක්ද ඇතුළුව තනතුරු 02 ක් සඳහා නිලධාරීන් 06 දෙනෙකු අතිරික්තව පැවතුණි. | 2022 සැප්තැම්බර් මස 30 දින වනවිට එහි පුරප්පාඩු 51 පැවතුණි.<br>දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දින වනවිට තාක්ෂණ සේවා නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරු 03 ක් හා තාක්ෂණ සේවා නිලධාරි (සිවිල්) I/II/III ශ්‍රේණියේ තනතුරු 15 පුරප්පාඩු වී පැවති බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 යටතේ කොන්ත්‍රාත් පදනමින් තාක්ෂණ සේවා නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරු 02 ක් හා කාර්මික නිලධාරින් 11 දෙනෙකු බඳවාගෙන ඇත.<br>නමුත් මේ වනවිට කොන්ත්‍රාත් පදනමින් සිටින්නේ 01 නිලධාරියෙකු පමණි. ස්ථාන මාරු ප්‍රතිපත්ති තුළ ස්ථිර නිලධාරින් ලැබුණු පසු එකී නිලධාරියාගේ සේවය ද අවලංගු කරන බව දන්වමි.<br>2022 පෙබරවාරි 28 දින වනවිට සංවර්ධන නිලධාරි අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද 37 දෙනෙක් ලබා දී ඇත. | පුරප්පාඩු තනතුරු පිරවීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩල අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කළමනාකරණ සේවා නිලධාරී සේවයේ 05 දෙනෙකුගේ ඌණතාවයක් පැවති බැවින්, එම ඌණතාවය අතිරික්ත සංවර්ධන නිලධාරින් මඟින් මගහරවා ගෙන ඇත. පරීක්ෂණාගාර කම්කරු තනතුර අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2021 මැයි 10 දිනැති ලිපියෙන් අයදුම් කර ඇත. | |
| (ආ) මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති විමර්ශනය කර ඒවායේ තත්ත්ව පරික්ෂාව, ගුණාත්මකභාවය සහ සිදුවී ඇති අක්‍රමිකතාවයන් අනාවරණය කරගනිමින් රජයට සිදුකර ඇති අලාභ හානි හඳුනාගෙන ඒ පිළිබඳ වාර්තා කිරීම සඳහා, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තියට අනුව පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් මනා වෘත්තීය සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරී තනතුරු 18 ක් පුරප්පාඩු වී පවතින බැවින් අභ්‍යන්තර විගණන ඒකකය සඳහා විමර්ශන නිලධාරින් පත්කිරීම අපහසු වී ඇත.<br>ඉදිරියේ දී අභ්‍යන්තර විමර්ශන කටයුතු සඳහා නිලධාරින් වෙන්කරවාගෙන එම ඒකකය සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වේ. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 557 - මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර අරමුදලින් සමිති 08 ක් සඳහා 1991 සිට 2016 දක්වා කාලය තුළ ලබාදී තිබුණු රු.2,945,813 ක ණය මුදලින්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට, වසර 05 සිට වසර 20 ක කාලයක් ගතවී තිබුණු රු.2,514,188 ක ණය අය කරගෙන නොතිබුණි. | අක්‍රිය සමිති 06 ක් පැවති අතර 2022 අගෝස්තු 25 දින පැවති පළාත් විගණන කමිටුවේ තීරණය අනුව සමිති වල වත්කම් වගකීම් නැවත සමාලෝචනය කර ණය පියවීමේ හැකියාව සලකා බලන ලෙස ලේකම් විසින් දන්වා ඇත. ඒ අනුව 2022 ඔක්තෝබර් 18 දිනැති ලිපිය මගින් දිස්ත්‍රික් කොමසාරිස්වරුන්ට වගකීම් පවරා ඇත.<br>එක් සමිතියක වත්කම් භාරයට ගෙන ඇවර කර වත්කම් විකුණා ලැබෙන මුදලින් ණය පියවා ගැනීමටත් උඩුදුම්බර විවිධ සේවා සමිතිය ණය මුදලෙන් ඉදිකළ ගොඩනැගිල්ලේ නීතිමය ආරවුල නිමවූ වහාම ගොඩනැගිල්ලේ ආදායමෙන් ගෙවීමට කටයුතු කරන බවත් නුවරඑළියේ කෘෂි සමූපකාර සමිතියට ණය මුදල ගෙවන ලෙසත් දැනුවත් කර ඇත. | කඩිනමින් ණය මුදල් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.13 ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 කට පසුව ද ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ මාස 02 කට පසුව ද නොපෙන්වන ලෙසට නිරවුල් කරගෙන තිබිය යුතු වුවද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාව තුළ හා ඉන් බැහැර වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 422 ක ගේ එකතුව රු.21,117,773 ක් වූ ණය ශේෂ හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 345 කගේ ණය ශේෂ එකතුව රු.20,326,816 ක් මාස 03 සිට වසර 05 ට වැඩි කාලයක් දක්වා නිරවුල් කරගෙන නොතිබූ අතර විශ්‍රාම ගිය නිලධාරින් 164 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,947,542 ක් වූ ණය ශේෂ මාස 03 සිට වසර 30 ට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගෙන නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ සිට විශ්‍රාම ගිය නිළධාරීන් 164 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.2,947,542 ක්වූ ණය ශේෂයන් නිළධාරීන් 15 දෙනෙකුගෙන් රු.400,209 ක මුදලක් මේ වන විට අය කරගෙන ඇති අතර තව දුරටත් නිළධාරීන් 149 ක ගෙන් රු.2,547,333 ක මුදලක් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | ජාතික අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු අතර විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් වාර්තාව අනුව 2019 වර්ෂයේ සිට ඉදිරියට එන රු.3,901,263 ක් වූ "තවදුරටත් බැංකු සැසඳුමේ වෙනස" සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2013 වර්ෂයේ සිට බැංකු සැසඳුම් නැවත සකස් කිරීම සිදු කරන බැවින් බැංකු සැසඳුම් වාර්තාවේ පවතින වෙනස 2022 දෙසැම්බර් 31 වන දින නිවැරදි කර දෙන බැව් නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ ගණකාධිකාරිගේ 2022 ඔක්තෝබර් 25 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. | බැංකු සැසඳුමේ වෙනස හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් අංශයේ රාජකාරී කරන නිලධාරීන් දෙදෙනෙකු විසින් වැටුප් ගෙවීමේ දී, ඔවුන්ගේ හා සමීපතමයින්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු.51,961,088 ක් සහ බැංකු ගිණුම් අංක මඟින් තහවුරු නොවන රු.1,077,550 ක් වශයෙන් එකතුව රු.53,038,638 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කර තිබුණි. වැටුප් කට්ටලවලට අදාළ ලිපි ගොනු හා ලේඛන පරිගණක මෘදුකාංග උපස්ථිත (Backup) විධිමත්ව හා සම්පූර්ණව ඉදිරිපත් නොකිරීම සහ මුරපද අමතක වීම, තාක්ෂණ දෝෂයන් පැවතීම හේතුවෙන් පරිගණක 02 ක උපස්ථිත (Backup) වලට ප්‍රවේශ වීමට නොහැකිවීම නිසා එම කාල සීමාවට අදාළව වංචා කර ඇති සම්පූර්ණ මුදල නිශ්චිතව හඳුනා ගැනීම ගැටළු සහගත විය. | මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සිදුව ඇති මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මේ වන විට වැටුප් කට්ටල රාජකාරි කළ නිලධාරීන් දෙනෙකුගේ සේවය අත්හිටුවා ඇති අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික විගණන කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් විමර්ශණ කටයුතු සිදු වෙමින් පවතින බව සඳහන් කරමි.<br>එසේම, මෙම සිදුවීමට සම්බන්ධ නිලධාරීන් හඳුනාගැනීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් මු.රෙ. 104 (4) පරීක්ෂණයක් ද සිදුකරමින් පවතින බව වැඩිදුරටත් සඳහන් කරමි. | පරීක්ෂණ අඛණ්ඩව පවත්වා වගකිවයුත්තන් හඳුනාගැනීම හා වංචා කළ මුදල තීරණය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඖෂධ අවශ්‍යතාවය හඳුනාගෙන ඇණවුම් කිරීමට කටයුතු නොකිරීමෙන් වූ ඖෂධ අතිරික්තය, අවශ්‍යතාවය සහිත රෝහල් හඳුනාගෙන බෙදාහැරීමට හෝ වෛද්‍ය සැපයුම් අංශය අමතා යැවීමට හෝ කටයුතු නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහනුවර වෛද්‍ය සැපයුම් අංශයේ, මහනුවර ළය රොහලේ හා මාතලේ මහ රෝහලේ රු.15,414,781 ක ඖෂධ තොග කල් ඉකුත් වී තිබුණු අතර ඉන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වී වසර 03 සිට 14 ක කාලපරාසයක් ගත වී තිබුණි. එමෙන්ම ඉහත ආයතනවල කල් ඉකුත් වීමට ආසන්න රු.10,426,052 ක ඖෂධ ද පවතින බව නිරීක්ෂණය විය. | **මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය**<br>2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතු වෙන් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට ඖෂධ සඳහා ඉල්ලුමක් නොමැතිවීම සහ රෝගීන්ගේ අඩුවීම සහ සායන නොපැවැත්වීම හේතුන් මත ඖෂධ තොග ඉතුරු වූ බවත්,<br><br>**මහනුවර ළය චිකිත්සාගාරය**<br>කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රෝහල් වෙත රෝගීන් පැමිණීම අඩු වීම හේතුකොටගෙන රෝහල් වලින් ඖෂධ නිකුත් කිරීම් අඩු වීම නිසා කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ ලබා ගැනීම අනෙකුත් රෝහල් වලින් ප්‍රතික්ෂේප කිරීම නිසා ඉතුරු වූ බවත්,<br><br>**මාතලේ මහ රෝහල**<br>2022 වර්ෂයේ සිට මාතලේ දිස්ත්‍රික් මහ රෝහල මධ්‍යම රජය වෙත පවරාගෙන ඇති බැවින් මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අපහරණ මණ්ඩලයක් මඟින් අපහරණය කර අවසන් කරන බවත් දන්වා සිටිමි. | ඖෂධ අවශ්‍යතාවය අනුව ඇණවුම් කිරීමටත් අතිරික්ත තොග වෙනත් රෝහල් වෙත බෙදා හැරීමටත් කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවලට අනුයුක්ත වාහනවලට සිදුවූ අනතුරු 65 කට අදාළ රු.32,525,081 ක අලාභ හානි සම්බන්ධයෙන්, අනතුරු සිදු වී වසර 01 ත් 15 ත් අතර කාලයක් ඉක්ම ගොස් තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වාහන අනතුරු 65 ට අදාළව සිදුව ඇති අනතුරු සම්බන්ධව මේ වන විට යාවත්කාලීන කරන ලද තොරතුරු ප්‍රාදේශීය කාර්යාල වලින් විමසා ඇති අතර එම තොරතුරු ලැබුණු විගස කාර්යාලයේ තොරතුරු සමඟ සසඳා ඉදිරිපත් කරමි. | අනතුරු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කර අලාභහානි අය කර ගත යුතුය. |
| (ඊ) | 2018 නොවැම්බර් 19 දින අනතුරට පත් තෙල්දෙණිය මූලික රෝහලට අනුයුක්ත ගිලන් රථය සම්බන්ධයෙන් පොලිස් වාර්තාව හා මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාව අනුව රථයේ යාන්ත්‍රික දෝෂයක් නොමැතිව රියදුරුගේ අධික වේගය හේතුවෙන් රථය පාලනය කර ගැනීමට නොහැකි වීම නිසා මෙම අනතුර සිදුව ඇති බව දක්වා තිබියදී එම වාර්තා නොසලකා අදාළ අනතුරින් රජයට වූ අලාභය රු.7,409,132 ක මුදල මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාව මඟින් පොතෙන් කපා හැරීමට අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2020 අගෝස්තු 13 දින අනුමත කර අලාභය කපාහැරීමට කටයුතු කර තිබුණි. | තෙල්දෙනිය දිස්ත්‍රික් මූලික රෝහලට අයත් WP LW – 1134 අංක දරණ ගිලන් රථය 2018 නොවැම්බර් 19 දින අනතුරට ලක් වීමට අදාළව සිදුවූ රු. 5,727,869 ක අලාභය මෙම ගිලන් රථය පැදවූ රියදුරුගේ ප්‍රමාද දෝෂයක්, නොසැලකිල්ලක්, හෝ අපරික්ෂාකාරී රිය ධාවනයක් නිසා සිදුවූ අනතුරක් නොවන බැවින් හානි පාඩු ලේඛණයෙන් ලියා අස් කිරීම සඳහා මු.රෙ.109 වාර්ථා නිර්දේශ කර 2022 ඔක්තෝබර් 20 දිනැති ලිපිය මඟින් අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | මු.රෙ. පරීක්ෂණ සඳහා පොලිස් වාර්තාව හා මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවන් සැලකිල්ලට ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ට) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ වැඩසටහන් හා ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී අරමුණට පටහැනි කාර්යයන් 16 ක් වෙනුවෙන් එකතුව රු.21,060,274 ක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණි. | ම.ප.සෞ.දෙපාර්තමේන්තුවේ ආයතන (දිගන පුනරුත්ථාපන රෝහල) සඳහා ගෘහ භාණ්ඩ මිල දී ගැනීම හා දිගන රෝහලට කෑම මේසයක් හා පුටු 06ක් මිල දී ගැනීම, කඩුගන්නාව ප්‍රාදේශීය සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කටයුතු හා උපකරණ මිල දී ගැනීම, නුවරඑළිය ප්‍රා.සේ.සේ.අ. කාර්යාලයේ ශ්‍රවනාගාරය අළුත්වැඩියා කිරීම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අළුත්වැඩියා කිරීම හා උපකරණ මිල දී ගැනීම, මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අළුත්වැඩියා කිරීම, රිකිල්ලගස්කඩ මූලික රෝහලේ විශේෂඥ වෛද්‍ය නිල නිවස අළුත්වැඩියා කිරීම, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල පුහුණු වැඩසටහන් හා 2021 ඇසළ පෙරහැර ස්වේච්ඡා සේවක අවසරපත්/පොත් පිටකවර මුද්‍රණය කිරීම යන කරුණු සඳහා වියදම් දරා ඇත. ඉහත සඳහන් මෙම වියදම් මහජනතාවට අත්‍යවශ්‍ය, ප්‍රාථමික සෞඛ්‍යයට අදාළ ප්‍රථමාධාර හා රෝග පාලන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍යවන පහසුකම් සපයා ගැනීම සඳහා වන බැවින් මෙය අරමුණට පටහැනි ක්‍රියාවක් නොවන බව දන්වා සිටිමි. | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ ඉටු වන අයුරින් ප්‍රතිපාදන යෙදවිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඍ) 2020 අගෝස්තු මස 20 වන දින වැලිසර පිහිටි ජාතික ක්ෂය රෝග විමර්ශන රසායනාගාරයෙන් (NTRL) ලැබී තිබුණු රුධිර පටක සාම්පල හා උපකරණ පරීක්ෂණයෙන් පසු ජීවානුහරණය සිදුකර බාහිර පරිසරයට මුදාහැරීම සිදුකරන අතර ඒ සඳහා රු.1,800,000 ක මුදලක් වැය කර Auto clave (50ml) යන්ත්‍රය මිලදී ගෙන තිබුණද, එය ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම නොතිබීම නිසා භාවිතයට නොගෙන වසරකට වැඩි කාලයක් ළය රෝහලේ නිෂ්කාර්යව පැවතුණි. | පසුගිය අවුරුදු කිහිපයේ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ මෙම යන්ත්‍රයේ මෘදුකාංග පිළිබඳව හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව රසායනාගාර කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීමට NTRL ආයතනයට නොහැකි විය. නමුත් මෙම Auto Clave යන්ත්‍රය NTRL ආයතනය මඟින් එයට අදාළ උපදෙස් ලබා ගෙන සේවා කටයතු සඳහා ආයතනයේ ස්ථාපිත කර ඇත.ඒ අනුව මෙම උපකරණය පිළිබඳව NTRL ආයතනයේ නිළධාරියෙක් විසින් උපකරණය ක්‍රියාත්මක කිරීම පිළිබඳව හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සෛද්ධාන්තික කරුණු හා ප්‍රායෝගිකව උපකරණය ක්‍රියා කරවීමට අදාළ උපදෙස්ද ලබා දී ඇත. එබැවින් එම උපකරණය දැනට සේවා කටයුතු සඳහා යෙදවා ඇති බව ආයතනභාර වෛද්‍ය නිළධාරිගේ (අත්සන නොමැත) අමුණා ඇති ලිපියෙන් පෙන්වා දී ඇත. | යන්ත්‍රය ක්‍රියාකාරී ලෙස උපයෝජනය වන බව වගකීමෙන් යුතුව තහවුරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ධාවන තත්ත්වයේ නොපවතින වාහන 03 ක් දිගුකාලයක සිට ගාල්කර තිබුණ ද එම වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අංක PB-7423 දරණ වාහනය අළුත්වැඩියා කර ධාවන තත්ත්වයට පත් කර ඇති අතර, අනෙකුත් වාහන, වෙන්දේසිය සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. | වාහන කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2019 මැයි 9 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබූ, මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ තීන්ත ආලේප කිරීම යනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබූ රු.3,114,905 ක මුදලින් 2022 නොවැම්බර් 02 දින වන විට නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.2,825,897 ක මුදල් අයකරගෙන නොතිබුණි. | මේ පිළිබඳව නිලධාරීන් දෙදෙනෙකුගෙන් මුදල් අයකරගෙන ඇති අතර අද දින වන විට අධිභාර කර ඇති මුලු මුදල රු.289,008 ක් වන අතර තව දුරටත් අධිභාර කිරීමට ඇති මුදල රු.2,825,897 ක් වේ. | ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය ප්‍රකාරව අයකර ගැනීමට ඇති සියළු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |

**1.5.14 ශීර්ෂය 563 - මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය යැයි තීරණය කරන ලද උපකරණ මිලදී ගැනීමට හා ඒවා එම ප්‍රතිලාභීන් වෙත | පුරෝකථනය කරන ලද ප්‍රමාණවලට ගනු ලැබුවද, පසු ගිය වර්ෂවල රට තුළ හා ලෝකයේම පැවැති විශේෂ අර්බුද (කොවිඩ් | උපකරණ ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කඩිනමින් ලබාදීමට කටයුතු කළයුතු වුවද එසේ නොකර මිලදී ගෙන තිබුණු රු.14,607,150 ක උපකරණ, 2022 මාර්තු 04 විගණිත දින වන විට දින 63 සිට වසර 4 කට වැඩි කාලයක් මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු ගබඩාවේ රඳවාගෙන තිබුණි. | වැනි) හේතුවෙන් නිකුත් වන ප්‍රමාණ වෙනස් විය. කෙසේ වුවද අවශ්‍යතාව ඇති වූ වහාම අවශ්‍ය උපකරණය සැපයීමට කටයුතු සිදු කරණ බව දන්වමි.<br><br>කිසියම් පුද්ගලයෙකුට ආබාධයක් සිදු වූ විගස ආබාධිත උපකරණ ලබා දීමේ අවශ්‍යතාව නිසා මෙසේ තොගයක් ගබඩාවේ රඳවා තබා ගැනීම සිදුවේ. | |
| (ආ) | මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වේරලවත්ත පිරිමි ළමා රැඳවුම් නිවාසයේ, කාන්තා රැඳවුම් නිවාසයේ හා ටිකිරි සෙවන ළමා නිවාසයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 08 ක පුරප්පාඩු 23 ක් පැවතුණි. | වේරවලවත්ත කාන්තා සහ පිරිමි ළමා රැඳවුම් නිවාසය, ටිකිරි සෙවන පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ තනතුරු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම් වෙත 2020 ජූලි 03/ 2020 ජූලි 22/ 2020 අගෝස්තු 26 යන ලිපි මඟින් ඉල්ලීම් කරන ලදී. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක :01/2020 මඟින් සියළුම ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ (PL-1, PL-2 හා PL-3) දැනට පවතින සියළුම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් නැවත දැනුම්දෙන තුරු අත්හිටුවා ඇති බැවින් ප්‍රධාන ලේකම්ගේ 2020 සැප්තැම්බර් 22 දිනැති ලිපිය මඟින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විශේෂ අනුමැතියක් ද ඉල්ලා ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 570 - මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය**

-----------------------------------------------------------

**1.5.15.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

-------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------------------- | ------------ |
| (අ) | පළාත් භාණ්ඩාගාරය විසින් ඉකුත් සහ සමාලෝචිත වර්ෂ වලට අදාළ පුනරාවර්ථන වියදම් දැරීම සඳහා මගී ප්‍රවාහන සේවා අධිකාරියට ලබා දී තිබුණු රු.124,000,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල පියවීම ප්‍රමාද වූ නමුත් මුළු අත්තිකාරම් මුදලින් රු. මිලියන 05 ක මුදලක් පියවීමට කටයුතු කර ඇත. | අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරු 19 කට අදාළව පුරප්පාඩු 91 ක් පැවතුණි. ඒ අතර නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකරු (සංවර්ධන හා පුහුණු) නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකරු (ප්‍රවාහන හා මෙහෙයුම්) හා නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකරු (මූල්‍ය හා පරිපාලන) යන ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරුද පුරප්පාඩුව පැවතුණි. | නව බඳවා ගැනීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රමාණවත් තරම් ආයතනයේ අරමුදල් නොතිබීම තවදුරටත් අදාළ පුරප්පාඩු පැවතීමට හේතු විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

(ඇ) මගී ප්‍රවාහන සේවා අධිකාරියට අදාළ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු මධ්‍යම පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් නිම නොකළ විගණන ඡේද පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| i. | 2008 අගෝස්තු 01 දිනැති අංක 50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවී නියමිත සීමාව ඉක්මවා සභාපතිවරයාට රු.406,955 ක ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණ ද එම මුදල් අයකර ගැනීම සඳහා අදාළ පාර්ශවය වෙත දැනුවත් කිරීමක් පමණක් සිදුකර තිබුණි. | වැඩිපුර ගෙවා ඇති ඉන්ධන දීමනා අය කර ගැනීමට අදාළ පාර්ශවය වෙත ලිපි මඟින් දැනුම් දීමට කටයුතු කර ඇත. මේ වන තෙක් ගෙවීම් සිදු කර නොමැති බැවින් නීතිමය පියවර ගැනීම සඳහා නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | පළාත් ගිණුම්කාරක සභා උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| ii. | අංක සීපී-කේබී-7924 දරන ජීප්රථයට සිදුවූ අනතුර හේතුවෙන් අලුත්වැඩියා කිරීම් සඳහා රු.716,753 ක මුදලක් වැයකර තිබුණු නමුත් රක්ෂණ හිමිකම් වලින් ආවරණය වී තිබුණේ රු.547,446 ක මුදලක් පමණි. රක්ෂණයෙන් ආවරණය නොවු රු.169,307 ක අලාභ ඊට වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කර ඔවුන් වෙත වගකීම් පවරා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මු.රී.54 අනුව පරීක්ෂණ පැවැත්වීමද මේ දක්වා සිදුකර නොතිබුණි. | එකී කාල සීමාවේ දී මු.රෙ 104 අනුව පරීක්ෂණ පවත්වා ඊට අදාළ අලාභය හා වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කොට නොමැති අතර මෙම අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104 අනුව පරීක්ෂණ පවත්වා ඉදිරි කටයුතු සිදු කර විගණනයට වාර්තා කරමි. | ප.මු.රී. 54 ප්‍රකාරව පරීක්ෂණ කඩිනමින් පැවැත්විය යුතුය. |

| | | |
|---|---|---|
| iii. අල්ලස් ලබා ගැනීමේ චෝදනාවට ලක් වූ සභාපතිවරයා අනිවාර්ය නිවාඩු යවා තිබුණු අතර, විධිමත් පරිදි යලි සේවයේ පිහිටුවීමකින් තොරව 2012 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රු.419,250 ක මුදලක් සභාපති දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | 2000 අංක 01 දරණ මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රඥප්තිය අනුව සභාපතිවරයා පත් කිරීම හා ඉවත් කිරීම ආදී සියළු බලතල ඇත්තේ විෂයභාර අමාත්‍යවරයාට වේ. මෙම සභාපතිවරයා ඉවත් කිරීමට අදාළව එවකට සිටි විෂයභාර අමාත්‍යවරයා ගැසට් නිවේදනයක් නිකුත් කර නොමැති අතර සභාපතිවරයාට අදාළ ගොනුව ද නඩත්තු වූයේ එවකට ප්‍රධාන හා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් බව දන්වමි. | ගිණුම්කාරක සභා තීරණය අනුව කටයුතු කළ යුතුය |
| (ඇ) මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සහ ප්‍රාදේශිය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ''සහන් පියස'' නිවාස ණය වැඩසටහන පිළිබඳ වූ අවබෝධතා ගිවිසුමේ 4 ඡේදය අනුව මෙම වැඩසටහනේදී අය කරනු ලබන සියයට 8 ක් වන පොලී මුදලින් පිළිවෙලින් සියයට 75 ක් ප්‍රාදේශිය සංවර්ධන බැංකුවට ද, සියයට 25 ක් නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රීය ගිණුමට ද බැර කළ යුතු වුවත් එම විධිවිධානවලට අනුකූල නොවන පරිදි 2015 දෙසැම්බර් මස නිවාස කොමසාරිස් නමින් විවෘත කරන ලද ඉතිරි කිරීමේ ගිණුමකට රු.1,074,687 ක මුළු පොළියම බැර කර තිබුණි. | පළාත් නිවාස දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඒකාබද්ධව ක්‍රියාත්මක කරන සහන් පියස නිවාස ණය වැඩසටහන පිළිබඳ 2017 දෙසැම්බර් 12 දිනැති ගිවිසුමට අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට හා පළාත් නිවාස කොමසාරිස්ගේ චක්‍රීය ගිණුමට පොළියෙන් සියයට 75 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවටද සියයට 25 ක් නිවාස දෙපාර්තමේන්තුවේ චක්‍රීය ගිණුමටද බැර කළ යුතු බව සඳහන් වේ.<br>ගිවිසුමේ ඇතැම් කරුණු කාලානුරූපව වෙනස් විය යුතු බැවින් නව ගිවිසුමකට එළඹීමට කෙටුම්පත් කරන ලද නව ගිවිසුම | නව ගිවිසුම අනුමත වන තෙක් පැවති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | 2021 ඔක්තෝබර් 14 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත අනුමැතියට යොමු කර ඇති අතර මේ වන විට එම ගිවිසුමේ ඉදිරි කටයුතු සඳහා නීති නිලධාරි වෙත යොමු කර ඇති බව දන්වමි. | |

**1.5.15.2 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය භාවිතා කරනු ලබන වාහන 41 න් වාහන 35 ක අයිතිය අධිකාරිය වෙත පවරා ගෙන නොතිබුණි. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මේ වන විට භාවිතයට ගනු ලබන වාහන/යන්ත්‍ර වල අයිතිය අධිකාරියට පවරා දීමට කටයුතු කර දෙන ලෙස 2021 අප්‍රේල් 02 දිනැතිව අමාත්‍යාංශ ලේකම් මඟින් ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් ලිපියක් යොමු කරන ලදී. 2021 ඔක්තෝබර් 06 දිනැතිව ලේකම් මාර්ග අමාත්‍යාංශය වෙත නැවත ඉල්ලීම් ලිපියක් ද යොමු කරන ලදී. | වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරියට අදාළ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු මධ්‍යම පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් නිම නොකළ විගණන ඡේද පිළිබඳ විස්තර පහත දැක්වේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයට අනුයුක්ත කර ඇති ලොරි රථ 04 ක ධාවන සටහන් වල සඳහන් කරුණු අනුව මුලින් දක්වා ඇති ලොරිරථ 03 ක ඉන්ධන ලීටරයෙන් කි.මී. 4 ක් ද අනෙකුත් ලොරි රථය ඉන්ධන ලීටරයකට කි.මී. 03 ක් වත් අවම වශයෙන් ධාවනය විය යුතු වුවත්, එම රථවල ඉන්ධන ලීටරයකට ධාවනය වන දුර පිළිවෙලින් කි.මී. 03 හා 02 ලෙස සලකා ඉන්ධන ගැලපීමට ඉඩ දී තිබුණි. මේ තත්ත්වය තුළ ආරම්භයේ සිට එම රථ සඳහා වැඩිපුර ලබාගෙන ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 169,229 ක් වූ අතර එහි ප්‍රසම්පාදන වටිනාකම රු.13,572,166 ක් විය. වැඩිපුර ලබාගෙන ඇති ඉන්ධන සඳහා අයකර ගැනීමට ගිණුම් කාරක සභාව නියෝග ලබා දී තිබුණ ද මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | මේ සඳහා කමිටුවක් පත්කළ අතර එහි පරික්ෂණ කටයුතු අවසන් කර ඇත. කමිටුව විසින් ලබා දුන් එම වාර්තාවේ දැක්වෙන පරිදි අලාභයක් සිදු වී නොමැත. ඒ අනුව එම වාර්තාව මු.රෙ.104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව මඟින් විගණනය වෙත යොමු කර ඇත. | ගිණුම් කාරක සභා තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | රු.15,284,898 ක් වැය කර පුවක්පිටිය වැලම්ටියාව මාර්ගය වැඩිදියුණු කිරීමේ කර්මාන්තය ඇතුළුව මාර්ග වැඩිදියුණු කිරීමේ කර්මාන්ත 10කට අදාළව 2017 ජූලි 31 දිනැති මධ්‍යම පළාත් ගිණුම්කාරක සභාවෙන් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම මාර්ග වැඩිදියුණු කිරීමේ ඡේද සඳහාම 2018 ජූලි 20 මධ්‍යම පළාත් රාජ්‍ය ගිණුම් කාරකසභාව එකම නියෝගයක් ලබා දී ඇත. ඡේදයේ සඳහන් මාර්ග 10 සඳහා මු.රෙ.104 පරික්ෂණ කමිටුවක් පත්කර ඇත. එහි පරික්ෂණ කටයුතු සිදු කෙරෙන අතර මේ වන විට එම පරීක්ෂණ කටයුතු අවසන් අදියරේ පවතී. | මු.රෙ. 104 පරික්ෂණ කඩිනමින් නිම කර පළාත් ගිණුම්කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයේ ලොරි රථ 03 කට අදාළව අවස්ථා 301 කදී ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවන පරිදි ඉන්ධන ලබාගත් බවට දෛනික ධාවන සටහන් ලියා රු.96,549 ක් වටිනා ඉන්ධන ලීටර් 3771 ක් අයථා ලෙස ලබා ගෙන තිබුණි. | මේ සඳහා කමිටුවක් පත් කර ඇත. ඒ අනුව මු.රෙ.104 පරික්ෂණ කටයුතු අවසන් කර වාර්තාව ලබා දී ඇත. මේ සම්බන්ධව ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමට නියමිත අතර ඒ අනුව අදාළ අයකිරීම් සිදු කරන බව දන්වා සිටිමි. | පළාත් ගිණුම් කාරක සභා නියෝගය අනුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | මිල වැඩිවීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කළ හැක්කේ මිල ගැලපුම් සූත්‍රය කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත්කොට තිබේ නම් පමණක් වුවද, එම නියමයන්ට පටහැනිව කොන්ත්‍රාත් 53 ක් වෙනුවෙන් රු.15,096,045 ක මිල වැඩිවීම් ගෙවා තිබුණි. | මෙම වාර්තාව සකස් කර ඇත. ඒ අනුව ඉදිරි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කිරීමට නියමිතය. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |

**1.5.15.3 මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පේෂකර්ම වැඩපල පිහිටුවීම හා පරිපාලනය පිළිබද වාණිජ අත්තිකාරම් ගිණුම**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 378.2 ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ ශුද්ධ ලාභය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවල නිශ්චිත ආදායම් ශීර්ෂයක් ඇත්නම් එම ශීර්ෂයටද, අනෙකුත් සෑම අවස්ථාවකදීම පළාත් සහා විවිධ ආදායම් ශීර්ෂයට ද | වාණිජ අත්තිකාරම් ගිණුමේ වර්ෂ අවසාන දිනට අතිරික්තතා ගිණුමෙහි රු.90,656,903 ක බැර ශේෂයක් පැවතියද මුදල් පොතට අනුව ශේෂය රු.23,224,934 කි. මෙම මුදල කාර්මිකා වැටුප් ගෙවීම් සඳහා මාසිකව රු. මි. 3 | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බැරකළ යුතු වුවද එසේ කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසන් දිනට අතිරික්තතා හා ඌණතා ගිණුමෙහි රු.90,656,903 ක බැර ශේෂය රඳවාගෙන තිබුණි. | කට ආසන්න මුදලක් සහ නිෂ්පාදන කටයුතු අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වන නූල්, ඩයි, හා රසායනික ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් නිශ්පාදන වියදම් දැරීම සඳහා වාර්ෂිකව රු. මි 80 කට ආසන්න වියදමක් දැරීමට සිදුවන අතර, මධ්‍යම පළාත් සභාවෙන් කිසිදු අරමුදලක් හෝ ප්‍රතිපාදනයක් ලබා නොගන්නා හෙයින්ද දෙපාර්තමේන්තු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හේතුවෙන් ද මෙම මුදල් ගිණුමේ රඳවා ගන්නා ලද බව දන්වමි. | |
| (ආ) | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මෙහෙයුම් කටයුතුවලින් රු.4,999,515 ක අතිරික්තයක් වූ අතර එයට වර්ෂයේ කල්පිත ගාස්තු ගැලපීමෙන් පසු අතිරික්තය රු.3,799,515 ක් විය. මෙම වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට ඍජුවම දායක වන පේෂකර්ම මධ්‍යස්ථානවල පේෂකර්ම උපදේශක, මුරකරු හා කම්කරු වැටුප් රු.94,338,950 ක් ගැලපීමෙන් පසු මෙහෙයුම් ප්‍රතිඵලය රු.89,339,435 ක ඌණතාවයක් විය. | පේෂකර්ම උපදේශික, මුරකරු හා කම්කරු තනතුර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු බැවින් ඔවුන්ගේ වැටුප් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුළ අන්තර්ගත කර වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කර ඇත. එබැවින් එම වැටුප් වියදමද පළාත් සභා වැය ගිණුමෙන් දරනු ලබන බැවින් අත්තිකාරම් ගිණුමට වැය බරක් ලෙස ඇතුළත් නොකෙරේ. මෙම කාර්ය සඳහා ඍජුවම දායක වන කාර්මිකාවන් සඳහා සිදු කරන ගෙවීම් වානිජ අත්තිකාරම් ගිණුමට ගලපා ඇත. මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීම එක් | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාල සියළු වියදම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අරමුණක් වන ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම සහ රැකියා සුරක්ෂිතභාවය වන බැවින් ලාභ ඉපයීම ප්‍රධාන අරමුණක් නොවේ.නමුත් නිශ්පාදන කාර්යයට සෘජුවම දරණ සියළු වියදම් ගැලපීමෙන් පසුවද රු.4,999,515 ක අතිරික්තයක් පෙන්නුම් කෙරේ. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ණයගැති ශේෂය රු.27,275,622 ක් වූ අතර ඉන් වර්ෂ 5ට වැඩි ණය ශේෂය සියයට 42.8 ක් හෙවත් රු.11,684,462 ක් විය. | ණය අයකර ගැනීම් කටයුතු අඛන්ඩව සිදු කරන අතර සමාලෝචිත වර්ෂයේ එනම් 2021 දෙසැම්බර් 31 දිනට පැවති ණයගැති ශේෂයෙන් 2022 අගෝස්තු 31 දින වන විට සියයට 46 කට ආසන්න මුදලක් එනම් රු.12,020,895 ක් අයවී ඇති අතර තවදුරටත් හිඟ ණයගැති ශේෂය රු.14,070,797 ක් වේ. ඉන් වර්ෂ 5 ට වැඩි රු.11,684,462 ක හිඟ ණය ගැති ශේෂයෙන් 2007 හා 2008 වර්ෂයන්ට අදාළව මු.රෙ. 104 පරීක්ෂණ පවත්වා කමිටු නිර්දේශ අනුව අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. | ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතුය. |

**1.5.16 ශීර්ෂය 582 - මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව**

---

මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන හා විකුණුම් පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.414,744,164 ක වත්කම් ශේෂ 05 ක් හා රු.293,350,026 ක බැරකම් ශේෂ 02 ක් සනාථ කිරීම සඳහා හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් උපලේඛන හා ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | වත්කම් ලේඛණගත කොට පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය 2017 අගෝස්තු 28 දිනැති 01/2017 අංක දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් පෙන්වා දී තිබුණද 2006 ජනවාරි 01 දින ස්ථාපිත කර ඇති කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව සතු වත්කම් 2021 වර්ෂය වන තෙක් තක්සේරු කොට ගිණුම්ගත කිරීමක් සිදුකොට නොතිබුණි.<br>2022 වර්ෂයේ දී සියළු ස්ථාවර වත්කම ලේඛන ගත කර ඉදිරිපත් කරමි. | වත්කම් හා බැරකම් ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කිරීම් කළ යුතුය. |
| (ආ) | නිෂ්පාදන හා විකුණුම් අත්තිකාරම් ගිණුමට අදාළව වාර්ෂික විසර්ජන පනතින් බලය දෙනු ලැබූ ලැබීම්වල අවම සීමාව රු.5,000,000 ක් වුවද, එම සීමාව රු.9,500,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් දිනට වර්ෂයේ ලැබීම්වල තථ්‍ය සීමාව රු.6,905,744 ක් වූයෙන් රු.2,594,256 | 2021 වර්ෂය සඳහා ලැබුණු නිෂ්පාදන හා විකුණුම් අත්තිකාරම් ගිණුමේ තත්‍ය ආදායම රු.6,905,744 කි.<br>දෙපාර්තමේන්තුව වෙත ලද රාජ්‍ය ඇණවුම්වල ආදායම සහ 2004 – 2021 දක්වා අය නොවී පැවති ණය ගැති ශේෂවල එකතුව රු.8,367,606 ක් වූ අගයද | වර්ෂයට අනුමත සංශෝධිත අවම ලැබීම් සීමාව තුළ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කින් අවම ලැබීම් සීමාවට ළඟා වීමට නොහැකි වී තිබුණි. | සැලකිල්ලට ගෙන ලැබීමේ අවම සීමාව රු.9,500,000 ක් ලෙස සංශෝධනය කරන ලදි.<br>එසේ වුවද 2004 – 2021 දක්වා අය නොවී පැවති ණය ගැති ශේෂවල එකතුව රු.318,066 ක් සහ 2021 වර්ෂය තුළ ඉටු කරන ලද රාජ්‍ය ඇණවුම් වෙනුවෙන් අය විය යුතු රු.8,049,540 ක් 2021 දෙසැම්බර් 31 වන විටත් අය නොවී පැවතුණි. ලැබීමේ අවම සීමාව සඳහා ළඟා වීමට නොහැකි වීමට එය හේතු වූ අතර ඉන් රාජ්‍ය ඇණවුම්වලින් අයවිය යුතු ආදායමින් රු.5,982,240 ක් 2022 වර්ෂය තුළ අය වී ඇත.<br>ඒ අනුව සංශෝධිත අවම ලැබීම් සීමාව වන රු.9,500,000 ද ඉක්මවා ආදායමක් ලබා ඇති බව දන්වමි. | |
| (ඇ) | පළාත් මූල්‍ය රීති 378.2 ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ ශුද්ධ ලාභය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවල නිශ්චිත ආදායම් ශීර්ෂයක් ඇත්නම් එම ශීර්ෂයටද, අනෙකුත් සෑම අවස්ථාවකදීම පළාත් සහා විවිධ ආදායම් ශීර්ෂයට ද බැරකළ යුතු වුවද එසේ කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසන් දිනට අතිරික්තතා හා ඌණතා ගිණුමෙහි රු23,110,343 ක බැර ශේෂය රඳවාගෙන තිබුණි. | මූල්‍ය රීති 378.2 ප්‍රකාරව වාණිජ අත්තිකාරම් ගිණුමෙහි මුදල් ශේෂය 2021 වසරේදී පළාත් සභා විවිධ ආදායම් වැය ශීර්ෂයට බැර කිරීමට නොහැකි වූ නමුත් 2022 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ලාභයෙන් දැරිය හැකි වියදම් හැර ඉතිරි ලාභය නියම කර ඇති විධිවිධානයන්ට අනුකූලව පළාත් සභා විවිධ ආදායම් අය ශීර්ෂයට බැර කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.17 ශීර්ෂය 583 - මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු ඉඩම, ගෘහස්ථ ක්‍රීඩාගාරය, පිහිනුම් තටාකය, ක්‍රීඩා පිටිය, ප්‍රධාන නැරඹුම් මැදිරිය හා භෝජනාගාරය තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් වහාම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු වත්කම් යටතේ ගිණුම්ගත කිරීමේ කටයුතු සිදු කරණ බව දන්වා සිටිමි. | සියළුම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**1.5.18 ශීර්ෂය 584 - මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර් 0.0633 ක ඉඩමේ භුක්තිය කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2009 නොවැම්බර් මස 16 දින එවකට සිටි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම්ගේ පෞද්ගලික නමට පවරා තිබුණු අතර, අදාළ ඉඩම 2022 මාර්තු 31 දින වන විටද දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණි. | මෙම කරුණට අදාළව දෙපාර්තමේන්තුව මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉදිරියේදී මේ සම්බන්ධව තවදුරටත් සොයා බලා ඉඩම් අයිතිය පවරා ගැනිමේ කටයුතු සිදු කරන බව දන්වමි. | ඉඩමේ අයිතිය ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීයව පවත්වාගෙන යනු ලබන කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන 12 ට අයත් වත්කම් විෂයන් 08 කට අදාළ ඒකක 707 ක් තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ඇති භාණ්ඩ වල වර්තමාන වටිනාකම තක්සේරු කිරීම සඳහා 2021 මාර්තු 22 පත්කල කමිටුවේ වාර්තා 2022 මැයි 22 දින දෙපාර්තමේන්තුව වෙත ලැබුණි. දිස්ත්‍රික්ක තුන තුළ පවතින කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන 12 හි වත්කම් 700 කට වැඩි ප්‍රමාණයක් පවතින අතර මේ වන විට එම වත්කම් වැඩි කොටසක් සිගාස් වැඩසටහනට ඇතුළත් කර අවසන්ව පවතී. | වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |

**1.5.19 ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වසර 02 ඉක්මවූ රු.1,517,861 ක කොන්ත්‍රාත්කරුවන් 10 දෙනෙකු ගේ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට තවදුරටත් රු.2,032,643 ක මුදලක් තැන්පත් ගිණුමේ පවතින අතර එයින් රු.1,128,292 ක රඳවුම් මුදල් එක් කොන්ත්‍රාත්කරුවෙකුට අයත් වේ. එම මුදල් නිදහස් කර ගැනිමට අදාළ ආයතනය ඉල්ලීම් කර ඒ සඳහා නිර්දේශ ලබා දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමුකර ඇත. ඉතිරි මුදලින් රු.514,782 ක වටිනාකමින් යුත් මුදල් සඳහා අදාළ ප්‍රතිලාභින් | ඉකුත් තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගෙන් විමසුවද ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලද බැවින් මු.රෙ 571 පරිදි එම මුදල් රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ බවත්,<br>තවදුරටත් ඉතිරි රු.389,569 ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුවන් 9 දෙනෙකුට අදාළ වන අතර ඒවා නිදහස් කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලෙස ඉල්ලා වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ලිපි යොමු කර ඇත. | |
| (ආ) | සෞභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ රු.10,000,000 ක් වෙන්කර තිබුණු ගල්පාලම ගොවිපලේ හරිතාගාර දෙකක් ඉදිකිරීම සඳහා ඉදිරිපත් වූ එකම මිල ගණන ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 42.92 කින් වැඩිවීම නිසා ඉදිකිරීම් කාර්යය අතහැර දමා තිබුණි. මේ සඳහා නැවත මිල ගණන් කැඳවීමක් හෝ හරිතාගාරයේ ප්‍රමාණයේ අඩුකිරීමක් හෝ අවම වශයෙන් එක් හරිතාගාරයක් ඉදිකිරීමට හෝ කටයුතු නොකිරීම හේතුවෙන් ගොවිපලට අත්‍යාවශ්‍ය හරිතාගාර අවශ්‍යතාවය සපුරාගැනීමට නොහැකිවී තිබුණි. | එක් ආයතනයකින් පමණක් ඉදිරිපත් කළ මිළ ගණන් තාක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කළ අතර එම මිළ ගණන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 42.92 ක් වැඩි බැවින් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර වට්ටම් ලබා ගන්නා ලෙස නිර්දේශ කර ඇත.<br>මේ පිළිබඳව විමසනු ලැබුවත් මිළ සංශෝධනයක් සිදු කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු දන්වා ඇත. එක් ආයතනයක් පමණක් මිළ ගණන් ඉදිරිපත් කළ බැවින් තරගකාරි මිලක් ඉදිරිපත් නොවීම හා ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 42.92 ක් වැඩි බැවින් හා නැවත මිළ ගණන් කැඳවා අදාළ ඉදිකිරීම සිදු කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බැවින් අදාළ ඉදිකිරීම අත්හැර දැමීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදි. | ප්‍රතිපාදන වෙන්කර තිබුණු අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |